# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## පැරෑලිය නැංගුරම් පලෙහි තිබෙන වැලි ඉවත්කිරීම සඳහා මිළ ගණන් කැඳවීම

**CFHC/SD/SAND/HIK/2021/40**

පැරෑලිය නැංගුරම් පලෙහි තිබෙන වැලි (කියුබ් 8063) ඉවත්කිරීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් **2021/07/15** දින **ප:ව 2.00** දක්වා කැඳවනු ලැබේ. වැලි ඉවත්කිරීම සඳහා **මාස 06 ක** කාලයක් පමණක් ලබා දෙනු ලබන අතර වැලි අප ආයතනය විසින් කැණීම්කර ලොරි රථවලට පටවා දෙනු ලැබේ. ඒ අනුව වැලි කියුබ් එකක මිල පැහැදිලිව සඳහන් කලයුතුය

අදාල මිළ ගණන් ඉදිරිපත් කිරීම සඳහා ලිඛිත අයදුම්පතක් යොමුකිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍රිකා සඳහා **රු 1000.00 ක** මුදලක් සංස්ථා ප්‍රධාන කාර්යාලයේ මුදල් භාරකරුවන් වෙත කාර්යාල දිනයන්හි **පෙ:ව 9.00 සිට ප:ව 3.00** දක්වා ගෙවීමෙන් අනතුරුව **2021/07/01 දින සිට 2021/07/14** වෙනි දින ප:ව 2.00 දක්වා ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයෙන් ලබා ගත හැකිය.**ලක්ෂ 02 ක** බැදුම්කරයක් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී කළයුතුය.

තවද මුදලින් ගෙවීම් කර ඉහත කරුණට අදාළ ලංසු ලේඛන කට්ටලය සංස්ථාවේ නිල වෙබ් අඩවියෙන් (**www.cfhc.gov.lk**) ලබාගත හැකිය. නැවත ගෙවනු නොලබන තැන්පතුව **ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 1446 දරණ සංස්ථා ගිණුමට** බැර කළ යුතු අතර ටෙන්ඩර් ලේඛනය සමග නැවත ගෙවනු නොලබන ගාස්තුවේ තැන්පතු පත්‍රිකා පිටපතක් ඉදිරිපත් කල යුතුය.

**එම මිල ගණන් අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15** පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් **2021/07/15** වන දින **ප:ව 2.00** ට ප්‍රථම එවිය යුතුය.

වැලි ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය බලපත්‍ර භූවිද්‍යා හා පතල් කාර්යාංශය වෙතින් ඔබ විසින් ලබා ගත යුතුය. තවද අවශ්‍ය වුවහොත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් ආයතනවල අවසරය ඔබ විසින් ලබාගත යුතුය.

ඔබ වෙත අදාල ටෙන්ඩරය ප්‍රදානය වුවහොත් ප්‍රථමයෙන් මුළු මුදලින් 25% ක මුදල් පලමුව සංස්ථාවට ගෙවිය යුතුය.

මිළ ගණන් ඉදිරිපත්කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"පැරැලිය නැංගුරම් පලෙහි වැලි ඉවත්කිරීම "** යනුවෙන් සඳහන් කල යුතුය.

මිළ ගණන් භාරගැනීම ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය. මෙම මිල ගණන් **2021/07/15 දින** **ප:ව 2.00** ට ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේදී විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. දුරකථන අංක 0112-525063 මගින් ප්‍රසම්පාදන කළමණාකාර වීමසීමෙන් වැඩි විස්තර ලබා ගතහැක.

සභාපති
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ,
අංක 15, රොක්හවුස් පටුමග,කොළඹ 15.